# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2354/03 – 2023 ඔක්තෝබර් මස 16 වැනි සඳුදා – 2023.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

I. **ඉඩමේ විස්තරය:** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත්සතර සුළු කොට්ඨාසයේ හුංගංගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MTR/2018/29 හා 2018.07.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්:

II. **පරවශතාවේ විස්තරය:** මාතර IV වන අදියර ජලසම්පාදන ක්‍රමය යටතේ ලවණ බාධකය ඉදිකරන ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'A' – පහලවත්ත හෙවත් වෙලබඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0100 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) නැගෙනහිරට සහ දකුණට: ශාන්ත සන්ධ්‍යා ලියනගේ සහ තවත් අය හිමිකම් කියන පහලවත්ත හෙවත් වෙලබඩවත්ත; බටහිරට: කැබලි අක්ෂර B සහ නුරානි සදාරා ලියනගේ හිමිකම් කියන අඹගහවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – අඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0050 ක් පමණ**

උතුරට: නුරානි සදාරා ලියනගේ හිමිකම් කියන අඹගහවත්ත නැගෙනහිරට: නුරානි සදාරා ලියනගේ හිමිකම් කියන අඹගහවත්ත සහ කැබලි අක්ෂර A; දකුණට: ශාන්ත සන්ධ්‍යා ලියනගේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සහ තවත් අය හිමිකම් කියන පහලවත්ත හෙවත් වෙලබඩවත්ත, පේමනන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන පරමඤ්ඤකැටිය සහ කැබලි අක්ෂර C; බටහිරට: පේමනන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන පරමඤ්ඤකැටිය සහ කැබලි අක්ෂර C සහ චතුරංගනී රුවංගිකා ලියනගේ හිමිකම් කියන අඹගහවත්ත.

03. **කැබලි අක්ෂර 'C' – පරමඤ්ඤකැටිය – ප්‍රමාණය: හෙක්. 0.0296 ක් පමණ**

උතුරට: පේමනන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන පරමඤ්ඤකැටිය, චතුරංගනී රුවංගිකා ලියනගේ හිමිකම් කියන අඹගහවත්ත සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: පේමනන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන පරමඤ්ඤකැටිය.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/WS/458.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
**"මිහිකත මැදුර"**,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 - 0171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී